# ශ්‍රී ලංකාවේ අතීත විදේශ සබඳතා පිළිබඳ පුරාණ කාසි ඇසුරින් අධ්‍යයනය කිරීම

කේ.සී.ප්‍රියදර්ශනී[1],ඩබ්.සී.මධුභාෂිනී[2],කේ.පී.එන්.මධුශානී[3], ඩබ්.කේ.අයි.චතුරංගී[4]
[1]chamali92827@gmail.com

ප්‍රමුඛ පදඃනෂ්ටාවශේෂ, නාණක, තාක්ෂණය,මූල්‍යම, විදේශ සබඳතා

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කාසි ඉතිහාසය සොයා බැලීමේ දී භාරතීය පැරණි කාසි වර්ගයන්ට සමගාමීව එය ආරම්භ වී ඇත. ඉන්දියාවේ ප්‍රථම දේශීය කාසි වශයෙන් පුරා විද්‍යාඥයන් හඳුනාගෙන ඇති කාසි වර්ගයක ඉතිහාසය ක්‍රි. පූ 4 වැනි සියවස දක්වා දිව යයි. මෙම කාසි රිදියෙන් සාදා තිබූ අතර උතුරු ඉන්දිවේ ප්‍රදේශ කේන්ද්‍ර කර ගෙන නිෂ්පාදන වී ඇත. එහි විශේෂත්වය වූයේ අක්ෂර දක්නට නොලැබීමයි.ප්‍රධාන සළකුණු පහක් මෙම කාසිවලින් විද්‍යාමාන වූ අතර ඒවා සත්ව රූප , ශාක රූප හා වෙනත් නිර්මාත්මක රූ සටහන්වලින් යුක්ත විය. මුල් යුගයේදී ලෝහ කුට්ටි වශයෙන් නිර්මිත වූ මෙම කාසි පසුව ක්‍රමයෙන් තාක්ෂණික රටා අනුව අදියර කිහිපයකින් නිකුත් වී ඇත. නියමිත බරක් සහිත ව ගෝලාකාර, වෘත්තාකර මෙන් ම ඉලිප්සාකාර ලෝහමය දිගැටි පතුරු එක්කර රටා උවමාන අකාරයට කපා මෙම කාසි නිර්මාණය විය. ශ්‍රී ලංකාවේ ක්‍රි. පූ 2 වැනි සියවසේ සිට කාසි භාවිතය සිදු වී ඇති බවට ඓතිහාසික තොරතුරු ඇත. අනුරාධපුර ගෙඩිගේ කැනීම් තුළින් ද මෙම කාසි හමු වී ඇත. මුල්කාලීන කාසි ලෝහමය වටිනාකම් සලකා මෙරට භාවිතා වූ බව විශ්වාස කෙරේ. අප රට තුළ මුදල් භාවිතය පිණිස යොදා ගනු ලැබූ ප්‍රධාන කාසි වර්ගය වූයේ උතුරු ඉන්දියාවේ ක්‍රි.පූ 4 වැනිසියවසේ නිකුත් කළ හස් එබූ කාසිය වේ. විශේෂයෙන්ම අනුරාධපුරය, කුරුණෑගල, ගම්පහ ප්‍රදේශවලින් මේවා හමුවී ඇත.

ශ්‍රී ලංකාව විවිධ දේශයන්හි ප්‍රසිද්ධ රටක් විය. දඹදිව වාසීන් අතර පමණක් නොව ග්‍රීක රෝම අරාබි යන ජාතීන් අතර අතීතයේ සිට ලංකාව ප්‍රසිද්ධව පැවතියේය. මෙම සබඳතා මුදල් ගණුදෙනු සිදු වූ අතර එහිදී මූලික වූයේ නාණක තාක්ෂණයයි. ඒ අනුව රටවල් අතර කාසි හුවමාරු වීම සිදු විය. යුරෝපීය බලපෑම් ඇති කළ ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම් විසින් විශාල දේපල අයිතිය හා පරිහරණ වර්ධනය පිළිබඳ අදහස් පැතිරුණි. ලංකාවේ පැරණි කාසි මෙන්ම මෙරට තිබී හමු වී ඇති කාසි හා යටත්විජිත යුගයේ මෙන්ම මෑත යුගයේ දී මුදල් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙම කාසි විදේශ සබඳතා තිබූ බවට සංකේතවත් වේ.

## අරමුණ

ශ්‍රී ලංකාව විදේශ රටවල් සමඟ පැවැත්වූ සබඳතාවලදී කාසි භාවිතය කොතෙක් දුරට බැලපෑවේ ද යන්න සොයා බැලීම මෙහි අරමුණු වේ.

## ක්‍රමවේදය

මෙහි දී දත්ත රැස්කිරීම ද්විතීයික මූලාශ්‍රය ඔස්සේ සිදු කළ අතර එහිදී ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාලය උපයෝගී කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත භාවිත කරමින් විශ්ලේෂණාත්මක නිගමනවලට එළඹිණි.

### විශ්ලේෂණය

පුරාවිද්‍යා වාර්තා අනුව සැම පළාතකම පාහේ තිබී රෝම තඹ කාසි හමුවී ඇති අතර රෝම කාසිද ලංකාවේ බහුලව භාවිත වී ඇත. රෝම රන් කාසි උඩු පැත්තේ රෝම අධිරාජ්‍යයකුගේ උඩුකය රුවක්ද යටිපැත්තේ හෙල්ලක් අතින් ගත් අධිරාජ්‍යයකුගේ හිටි රුවක්ද වේ. මෙම කාසි බොහෝ සෙයින් භාවිත වී තිබූ නිසා ලංකාව සහ රෝම අධිරාජ්‍ය සමඟ වෙළඳ සබඳතා තිබූ බව ඉන් සනාථ වේ. සිගිරියේ නෂ්ටාවශේෂ අතර තිබී සොයා ගත් කාසි 1687 න් 12 ක් හැර අන් සියල්ලම රෝම කාසි බව ජාතික කෞතුකාගාරයේ ඇති තොරතුරුවලින් හෙලිවේ. මෙරට නිපදවන ලද රෝම කාසි විශාල තොගයක් මාතර නාවිමන ප්‍රදේශයෙන් හා සිගිරිය, අනුරාධපුර ප්‍රදේශවල තිබී සොයා ගෙන තිබේ.

ශ්‍රී ලංකාව සමඟ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ ලියකියවිලි සුලභ නොවුව ද චීන හා රෝම පැරණි ලියකියවිලිවල සඳහන් තොරතුරුවලින් ඒ පිළිබඳ කිසියම් අවබෝධයක් ලබා ගත හැකිය. මෙයට අමතර පෘතුගීසි කාසි හා ලන්දේසි කාසි ලංකාවේ ව්‍යාප්ත වීමට පසුබිම් වූ හේතු සොයා බැලීම ද වැදගත් වේ. පෘතුගාලයේ හෙන්රි කුමාරයා විසින් දිරි ගැන්වූ පෘතුගීසි නාවිකයෝ පෙරදිගට පැමිණිය හැකි මුහුදු මාර්ග සොයා ගැනීමත් සමඟ ඉන්දියන් සාගරයට ඇතුළු වී පෙරදිග රාජ්‍ය සමඟ වෙළඳ සබඳතා ගොඩනගා ගත්තේය. එහිදී බොහෝ රටවල් ස්වකීය පාලනයට නතු කර ගෙන එකී සබඳතා ශක්තිමත් කර ගන්නා ලදී. පෘතුගීසි සිය අභිමතාර්ථ මත ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශවල කාසි පමණක් නොව භාණ්ඩ හුවමාරුව සඳහා යොදා ගත් වටිනා වස්තූන් කොල්ලකාගෙන ඒ රටවල්වලට ගෙන ගියේය. පෘතුගීසීන් වෙනම ම කාසි අච්චු ගැසූහ. ඕලන්ද යුගයේ මුල් අවධියේදී ප්‍රතිකාල් කාසිම භාවිතයට ගෙන ඇත. ඉංග්‍රීසිහු ද ඕලන්ද ගිවිසුමට ප්‍රකාරව මහජනයා වෙත 5000 ක් නෝට්ටු මාරු කර දීමට පෙළඹුනහ. ක්‍රි.ව 1815 දී මුළු දිවයිනම බ්‍රිතාන්‍ය පාලනයට නතු වූ බැවින් සිංහළ රාජ්‍ය බලය වෙනුවට මහා බ්‍රිතාන්‍ය රැජිනගේ හෝ රජුගේ රූ සටහන් සහිත කාසි නිකුත් වූ අතර ඒවා භාවිත කරන්නට ජනතාවට සිදු විය. 1948 ලංකාව නිදහස ලැබීමෙන් පසු මෙරට නිකුත් වූ කාසි පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ලංකාවේ තඹ කාසිය වෙනුවට පවා වටිනාකමක් නැති තත්ත්වයක් ගොඩ නැගුණි.

නාණක විද්‍යා මුලාශ්‍ර අධ්‍යයනය කිරීමෙන් අතීත සමාජයේ ආර්ථික, දේශපාලන, වෙළඳ විදේශ සබඳතා, ආගමික, සංස්කෘතික ආදී සමාජීය තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කළ හැකිය. මෙහිදී අවධානයට යොමු වූයේ විදේශ සබඳතා පිළිබඳ ව බැවිනි. ශ්‍රී ලංකාව තුළ විදේශ සබඳතා ගොඩනැගීමේ දී අරාබි, රෝම, ඉන්දීය, ලන්දේසි, පෘතුගීසි ආදී සෑම විදේශ සබඳතාවක් තුළම කාසි හුවමාරුවක් වී ඇති අතර එවැනි සබඳතා ගොඩවාය, අකුරුගොඩ, සීගිරිය ආදී රට අභ්‍යන්තරයේ ප්‍රදේශ තුළින් ද හඳුනාගත හැකිය.

### ආශ්‍රිත ග්‍රන්ථ

ජයසිංහ, කරුණාරත්න. (2006) ***ශ්‍රීලංකාවේ පුරාණ මුදල් සහ විදෙස්වෙළඳ ගනුදෙණු.*** මීරිගම: නේවර් පබ්ලිකේෂන්.

ප්‍රේමතිලක,පී.එල්. (1970)***පුරාණ ඉන්දියාවේ කාසි.***ඇම්.ඩී ගුණසේන සහ සමාගම.

ලීලානන්ද, කල්දේර. (1959)***ලංකාවේ මිල මුදල්.*** ජාතික කෞතුකාගාරය.